# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## නර්තනය - I

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 1යි

**ප්‍රශ්න අංක 01 සිට 40 දක්වා සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01) අතීතයේ ගර්භ සංරක්ෂණ පූජාවක් සඳහා පවත්වන ලද්දේ ............................. ය.
1) කොහොඹා කංකාරිය 2) කෝලම් නාටකය
3) පහන් මඩුව 4) ජන නාටක

02) කෝලම් නාටක චරිත නිරූපණයේ දී ........................... මානුෂ චරිත ලෙස සැලකේ.
1) ගුරුළු රාක්ෂ, නොංචි, පොලිස් 2) නාගරාක්ෂ, ජසයා, අණ බෙර
3) මුදලි, ලෙංචිනා, පොලිස් 4) ලෙංචිනා, ජසයා, ආරච්චි

03) කාරිය කරවන රාළ විසින් .............................. චරිත රඟ මඩලට පිවිසීම හඳුන්වා දෙනු ලබයි.
1) කෝලම් 2) සොකරි 3) නාඩගම් 4) රූකඩ

04) ජන ජීවිතය හා බැඳි වෘත්තීන් හා සම්බන්ධ නොවන ගැමි නැටුම් වශයෙන් ........................ නැටුම් සැලකිය හැකිය.
1) ගොයම්, කුළු, මෝල්ගස් 2) චාමර, පතුරු, සවරම්
3) මෝල්ගස්, වේවැල්, කුළු 4) ගොයම්, තාලම්, කුළු

05) පොළොන්නරු යුගයේ දී සරස්වතී මණ්ඩපය ඉදිකරනු ලැබුයේ ........................... විසිනි.
1) නිශ්ශංකමල්ල රජතුමා 2) ධාතුසේන රජතුමා
3) දුටුගැමුණු රජතුමා 4) මහා පරාක්‍රමබාහු රජතුමා

06) ..................... හින්දු බාලිකාවන් 500ක් ගී ගයමින් නැටූ බව ඉබන් බතුතා වාර්තා කර ඇත.
1) සමන් දේවාලයේ 2) උපුල්වන් දේවාලයේ
3) කතරගම දේවාලයේ 4) පත්තිනි දේවාලයේ

07) "රූමත් තරුණියන් ලස්සනට නටත්" යනුවෙන් මහනුවර පෙරහැර පිළිබඳව වාර්තා තබා ඇත්තේ ........................... නම් විදේශිකයා විසිනි.
1) ස්පිල් බර්ජන් 2) රොබට් නොක්ස්
3) ජෝන් ඩේවි 4) ජෝන් කැලවේ

08) නිළියක මණ්ඩියට සිටින රූප ඇතුලත් ලී කැටයම් රාශියක් ................................ දැකිය හැකිය.
1) ගඩලාදෙණිය විහාරයේ දී 2) පනාපිටිය අම්බලමේ දී
3) ඇම්බැක්කේ දේවාලයේ දී 4) රිදී විහාරයේ දී

09) රජයේ පාසල්වල සෞන්දර්ය විෂය අනිවාර්ය කරන ලද්දේ ........................ වර්ෂයේ දී ය.
1) 1972 2) 1974 3) 1978 4) 1968

10) පණ්ඩුකාභය රජතුමා ඉදිරියේ දී දෙව් මිනිස් නැටුම් කරවූ බව ................................ සඳහන් වේ.
1) දීප වංශය 2) මහා වංශය 3) රසවාහිනිය 4) චූල වංශය

11) මඩු ශාන්තිකර්ම වලදී ප්‍රථමයෙන් ……………………….. ප්‍රධාන චාරිත්‍රය ලෙස සිදුකරනු ලබයි.

1) තොට පේ කිරීම  2) මල පේ කිරීම
3) මඩු පේ කිරීම  4) කප් සිටුවීම

12) කොහොඹා කංකාරි ශාන්තිකර්මයෙහි අන්තර්ගත නාට්‍යමය පෙළපාලි …………………….. වන්නේ

1) අඹ විදමන සහ ගුරුගේ මාලාව  2) ගුරුගේ මාලාව සහ යක්කම්
3) යක්කම් සහ ආවැන්දුම  4) අඹ විදමන සහ හත් පදය

13) "හගලේ යැදීම" නම් වූ චාරිත්‍ර විධිය දැකිය හැකි ශාන්තිකර්මයකි, ……………………

1) කොහොඹා කංකාරිය  2) දෙවොල් මඩුව
3) පහන් මඩුව  4) ගම්මඩුව

14) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දී පමණක් දක්නට ලැබෙන සුවිශේෂී වාදන අවස්ථාවකි.

1) මඟුල් බෙර  2) අත්‍යාබෙර  3) පිං බෙර  4) යහන් බෙර

15) රාජ්‍ය අනුග්‍රහය ඇතිව නිර්මාණය වූ ගායනා විශේෂයකි.

1) නමස්කාර ගායනා  2) ජන ගායනා
3) ප්‍රශස්ති  4) සවුදම්

16) පිළිවෙලින් උඩරට ගොඩ සරඹ හා පහතරට ඉලංගම් සරඹ අවසන් කරනුයේ

1) සීරුමාරුව හා කස්තිරමෙනි  2) කස්තිරම හා අඩව්වෙනි
3) ඉරට්ටිය හා කස්තරමෙනි  4) කස්තිරම හා ඉරට්ටියෙනි

17) සරඹ අභ්‍යාසයේ දී තාලාවබෝධය සඳහා භාවිතයට ගනු ලබන්නේ,

1) මධ්‍ය ලය  2) ත්‍රිවිධ ලය  3) විලම්භ ලය  4) ද්‍රැත ලය

18) "සත් දින දොස හැර දෙපා තබන්නේ" මෙම කවි පදය අයත් නර්තනය වන්නේ,

1) කළගෙඩි  2) ගොයම්  3) පතුරු  4) මෝල් ගස්

19) ක්‍රෝධය ස්ථායි භාවයෙන් උපදින රසය වන්නේ

1) වීර රසයයි  2) භයානක රසයයි
3) රෞද්‍ර රසයයි  4) හාස්‍ය රසයයි

20) "ලත් තැනින් කියත් බාසෙන් රට ගන්ටා" මෙය

1) හටන් කවියකි  2) රබන් කවියකි
3) ලී කෙළි කවියකි  4) පන්තේරු කවියකි

21) රස භාව පිළිබඳ නන්දිකේශ්වරයන් විසින් පලකරන ලද කෘතිය වන්නේ මින් කුමක්ද?

1) නාට්‍ය ශාස්ත්‍රය  2) භගවත් ගීතාව
3) අභිනය දර්පනය  4) ගීත ගෝවින්දය

22) එක් මුහුණතක් සහිත භාණ්ඩයක් වන රබාන භාණ්ඩ වර්ගීකරණයේ දී ගැනෙන්නේ,

1) ආතත ගනයට ය  2) ආතත විතත ගනයට ය
3) විතත ගනයට ය  4) සුසිර ගනයට ය

23) "ශාප් මෝචන්" නැමති මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

1) බිතෝවන්  2) උදය ශංකර්
3) රාම් ගෝපාල්  4) රබීන්ද්‍රනාත් තාගෝර්

24) නර්තනයේ දී ප්‍රායෝගික කොටස් භාවිතා කරන ආකාරය ලියා දැක්වීම හඳුන්වන්නේ

1) අනුකරණය ලෙසය  2) ප්‍රශ්ථාරකරණය ලෙසය
3) රංග රචනය ලෙසය  4) සංස්කරණය ලෙසය

25) දේශීය වන්නම් නර්තනයේ දී වඩාත් වැදගත් වන්නේ මින් කුමන වර්ගයද?
1) රිද්මයානුකූල චලන
2) තාලානුකූල චලන
3) ප්‍රකාශනාත්මක චලන
4) සංචාරී චලන

26) භරත හා කතක් නර්තනයට යොද ගන්නා වාද්‍ය භාණ්ඩ පිළිවෙලින් දක්වෙන්නේ
1) මෘදංගය හා තබ්ලාව
2) චෙංඩාව හා මෘදංගය
3) මද්දලය හා චෙංඩාව
4) තබ්ලාව මා මද්දලය

27) කථක් නර්තනය සඳහා භාවිතා කරන රංග වස්ත්‍රාභරණ කොටස් කීපයකි.
1) ලෙහෙඟා හා උත්තරීයම්
2) කිරීටම් හා දෘපට්ටා
3) රාක්කුඩි හා මංජිරා
4) ලෙඟො හා දෘපට්ටා

28) භාරත නාට්‍ය සම්ප්‍රදයේ දී පළඳිනු ලබන ආභරණ දක්වෙන්නේ
1) කොක්කුම්බි, රාක්කඩි
2) උච්චපට්ටම්, සේලය
3) නේත්‍ර පට්ටම්, කාසි මාලෙයි
4) කිරීටම්, මංජිරා

29) කථක් නර්තන සම්ප්‍රදයට අයත් සංගීත සම්ප්‍රදය වන්නේ
1) උත්තර භාරතීය හින්දුස්ථානී සංගීතය
2) දක්ෂිණ භාරතීය කර්නාට සංගීතය
3) දක්ෂිණ භාරතීය හින්දුස්ථානී සංගීතය
4) උත්තර භාරතීය කර්නාට සංගීතය

30) කථක් හා භරත නර්තන සම්ප්‍රදයන් වලට අයත් නර්තන අංග වේ.
1) පරන් හා රාස්ලීලා
2) පදම් හා තෝඩායම්
3) පරන් හා ජතීශ්වරම්
4) ආලාරිප්පු හා රාස්ලීලා

31) උඩරට වන්නම් 18ට අයත් නොවන වන්නමකි.
1) උකුසා වන්නම
2) මයුරා වන්නම
3) තිසරා වන්නම
4) ගජගා වන්නම

32) උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් කොටස් කීපයකි.
1) අවුල්හැරය, හඟල
2) සිලම්බු, කාගුල්
3) රාහු, නළල් පට
4) අවුල් හැරය, සේලය

33) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ එන ගායන සහිත නර්තන අංගයකි.
1) හත් පදය
2) මඩු පුරය
3) ආවැන්දුම
4) යක් ඇනුම

34) මාත්‍රා 3 + 4 දෙතිතට අයත් කස්තිරමක කොටස් වනුයේ
1) රුද ගත ගත ගත කුකුදත් …..
2) කුද ගජිත කුද ගජිත ……
3) ජිකුතක තරිකිට කුන්දත් …..
4) රුදග ජින්තක තකට කුන්දත් …..

35) "තා තෙයි තා තෙයියත් තා" යන පා සරඹ පදය අයත් වන්නේ
1) දෙවන පා සරඹයට
2) හත්වන පා සරඹයට
3) පස්වන පා සරඹයට
4) තුන්වන පා සරඹයට

36) "අක්යාල වෙන්කිරීම" යන චාරිත්‍ර විධිය අයත් වන ශාන්තිකර්මය තෝරන්න.
1) දෙවොල් මඩුව
2) පහන් මඩුව
3) කොහොඹා කංකාරිය
4) බලි ශාන්තිකර්මය

37) මාත්‍රා 2+2+3 තිතට අයත්වන තාල රූපය කුමක් ද?
1) දෙසුලු මහ තුන්තිත
2) දෙසුලු මැදුම් දෙතිත
3) මැදුම් දෙසුලු තුන්තිත
4) දෙසුලු මැදුම් මහ තුන්තිත

38) උඩරට වන්නමකට අයත් කොටස් ගණන වනුයේ

1) හතරකි 2) පහකි 3) හයකි 4) හතකි

39) පායිම්පත හා ශිඛා බන්ධනය අයත් ඇඳුම් කට්ටලය කුමක්ද?

1) පන්තේරු ඇඳුම් කට්ටලය 2) නෛයියඩි ඇඳුම් කට්ටලය

3) වෙස් ඇඳුම් කට්ටලය 4) උඩැක්කි ඇඳුම් කට්ටලය

40) ගැට බෙරය වාදනයට අදළ වන පද කොටස සොයන්න.

1) ජිංකිට තත් තත් කිටිතක 2) ගුන්ද දෙගත ගතිගත ගුද

3) ජිංත තකට තත් කුද ගත 4) දෝං ගුංද ගතිගත ගුද